# විශේෂ නිවේදනයයි !

ඊශ්‍රායලයේ වෙසෙන සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත,

## <u>විදේශගත ශ්‍රී ලාංකිකයින් සඳහා "ශ්‍රී ලංකාව අමතන්න (Contact Sri Lanka) " මාර්ගගත ද්වාරය (Online Portal) දියත් කිරීම</u>

ඊශ්‍රායලයේ කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මීට පෙර පල කරන ලද නිවේදන වලට වැඩිමනත් වශයෙනි.

ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා අමාත්‍යාංශය විසින් රැකියා, අධ්‍යාපන හෝ වෙනත් හේතූන් මත පදිංචිව සිටින හෝ විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයන්හට **COVID – 19** වසංගතය පැතිරීම වැනි හදිසි අවස්ථා වලදී ඔවුන්ට අවශ්‍ය සහය ලබා ගැනීම සඳහා ස්වේච්ඡාවෙන් ලියාපදිංචි විය හැකි "ශ්‍රී ලංකාව අමතන්න" **(Contact Sri Lanka)** නමැති මාර්ගගත ද්වාරය **(Online Portal)** ආරම්භ කර ඇත.

මෙම මාර්ගගත ද්වාරයේ **(Online Portal)** ලියාපදිංචි වීම මගින් මෙවැනි හදිසි අවස්ථා වලදී ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා අමාත්‍යාංශය හා සම්බන්ධ වීමට සහ එහි සහාය ලබා ගැනීමට විදේශගත ශ්‍රී ලාංකිකයන්හට අවස්ථාව ලැබෙන අතර එමගින් විදේශගත ශ්‍රී ලාංකිකයින්, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ ශ්‍රී ලංකාවේ පිහිටි අදාල ආයතන සමඟ සම්බන්ධ කරනු ඇත. මෙම මාර්ගගත ද්වාරය **(Online Portal)** නිල තොරතුරු මූලාශ්‍රයක් ලෙස මෙන්ම විදේශගත ශ්‍රී ලාංකිකයන්හට රජය විසින් සපයනු ලබන සේවාවන් ලබා ගැනීමට දිගු කාලීනව ඉවහල් වනු ඇත.

ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත මෙම මාර්ගගත ද්වාරය **(Online Portal)** ආරම්භ කරන ලද අතර එමගින් **COVID - 19** වසංගතය පැතිර යාමට එරෙහිව දියත් කරනු ලබන ශ්‍රී ලංකාවේ ඒ හා අදාළ සියලුම ආයතනයන්ගේ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සහ හදිසි අවස්ථාවන්හිදී ඩිජිටල් තාක්ෂණය උපයෝගී කර ගනිමින් විදේශගත ශ්‍රී ලාංකිකයින්හට කඩිනම් හා කාර්යක්ෂම සේවාවක් සැපයීමටද කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වන "www.mfa.gov.lk" හෝ "www.contactsrilanka.mfa.gov.lk" මඟින් විදේශගත ශ්‍රී ලාංකිකයින්හට "ශ්‍රී ලංකාව අමතන්න" **(Contact Sri Lanka)** මාර්ගගත ද්වාරය **(Online Portal)** වෙත පිවිසිය හැකිය.

එබැවින්, ඉහත මාර්ගගත ද්වාරයෙහි **(Online Portal)** හැකි ඉක්මනින් ලියාපදිංචි වන ලෙස ටෙල් අවිව්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ඊශ්‍රායලයේ සිටින සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාවේ සාමාජිකයින් දිරිමත් කරයි.

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවීව්, ඊශ්‍රායලය

26.03.2020